දිවයින
2019/12/28
පිටු අංක 11

# 2019 ආර්ථික වර්ධන වේගය 2.8% යි

## ශ්‍රී ලංකා මහ බැංකුව කියයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

**මේ වර්ෂයේ (2019) ආර්ථික වර්ධන වේගය සියයට 2.8 ක් පමණ දක්වා පහත වැටෙනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.**

එසේම මේ වර්ෂයේ තුන්වැනි කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 2.7 ක් වී ඇති බව ද එසේම මේ වසරේ (2019) පළමු කාර්තු තුනේ සාමාන්‍ය ආර්ථික වර්ධනය සියයට 2.6 ක් බව ද මහ බැංකුව කියයි.

මේ තොරතුරු අනාවරණය වූයේ ඊයේ (27 දා) මහ බැංකු මූලස්ථානයේදී පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදීය.

මෙහිදී කතා කළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා කීවේ ලබන වසරේ (2020) දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4 ත් 4.5 ත් අතර අගයකින් වර්ධනය වනු ඇති බවයි.

එසේම මැදිකාලීනව සියයට 6.5 ක ආර්ථික වර්ධනයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බව ද අමරසේකර මහතා තවදුරටත් කීවේය.

මේ වසරේ පළමු කාර්තු තුනේ සියයට 2.6 ක ආර්ථික වර්ධනය සඳහා කෘෂිකර්ම අංශය සියයට 2.1% කින් ද කාර්මික අංශය සියයට 2.6 කින් සහ සේවා අංශය සියයට 2.8 කින් ද වර්ධනය වෙමින් දායක වී ඇත.

නව මහ බැංකු අධිපති මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මේ මාධ්‍ය හමුවට මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සහ මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතා ඇතුළු මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක් සහභාගි වූහ.